# පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## ඇමරිකානු ඩොලර් මිලියන 250 ට වැඩි විදේශ මූල්‍යාධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධීකරණය, අධීක්ෂණය, මෙහෙයවීම හා පාලනය සඳහා වූ ඒකකයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් විදේශ මූල්‍යාධාර යටතේ, ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් හා ඒවායේ සේවා කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි.

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන මාර්ග ව්‍යාපෘති, අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති, පානීය ජල ව්‍යාපෘති, ගොඩනැගිලි / පාලම් ව්‍යාපෘති සහ අධ්‍යාපන පහසුකම් ව්‍යාපෘති වැනි ව්‍යාපෘති මතා කොට සම්බන්ධීකරණය හා පාලනය කරමින් රජයේ ආයෝජන සැලැස්ම යටතේ හඳුනා ගනු ලබන සංවර්ධන ඉලක්ක නියමිත කාලය තුළ ලඟා කර ගැනීම සඳහා පිහිටුවනු ලැබූ ව්‍යාපෘති සැලසුම් ඒකකයේ පහත පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. අභ්‍යන්තර විගණක - තනතුරු 02

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබාගත් උපාධියක්

    සමග

    උපාධිය සම්පූර්ණ කළ දින සිට අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 14 ක පළපුරුද්දක් තිබීම. මෙයින් වසර 7 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්ය වේ.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

    සමග

    පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණකාලීන සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 12 ක පළපුරුද්ද.

03. රජයේ දීප ව්‍යාප්ත සේවයන්ගේ පළමු පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමක තනතුරක් දැරීම සමග

    වසර 11 ක් පළමු පන්තියේ නිලධාරියෙකු ලෙස පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.

- **වැටුප් තලය :** 2016.03.24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS3 වැටුප් මට්ටම අනුව වේ. ඉහත වැටුපට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනාවන්ද ගෙවනු ලැබේ.

### 02. ප්‍රසම්පාදන විශේෂඥ - තනතුර 01

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් විෂය ක්ෂේත්‍රයට අදාළව ලබාගත් උපාධියක්

    සමග

    උපාධිය සම්පූර්ණ කළ දින සිට අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 14 ක පළපුරුද්දක් තිබීම. මෙයින් වසර 7 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්ය වේ.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක්

    සමග

    පශ්චාත් උපාධියක් හෝ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණකාලීන සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක වසර 12 ක පළපුරුද්ද

03. රජයේ දීප ව්‍යාප්ත සේවයන්ගේ පළමු පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන මට්ටමක තනතුරක් දැරීම සමග

    වසර 11 ක් පළමු පන්තියේ නිලධාරියෙකු ලෙස පළපුරුද්දක් ලබා තිබීම අනිවාර්යය වේ.

- **වැටුප් තලය :** 2016.03.24 දිනැති අංක 1/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ PS3 වැටුප් මට්ටම අනුව වේ. ඉහත වැටුපට අමතරව රජයේ අනුමත අනෙකුත් දීමනාවන්ද ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි :**

- **වයස :** වයස අවුරුදු 65 අඩු විය යුතුය. (2017.07.21)
- සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය සේවකයාගේ මාසික වැටුපෙන් 8% ක ප්‍රතිශතයක්වන අතර, සේව්‍යයාගේ සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීමේ ප්‍රතිශතය 12% ද, සේවක භාරකාර අරමුදලේ ගෙවීම 3% ක්ද වේ.
- **සේවා කොන්දේසි -** මෙම තනතුර මූලික වශයෙන් එක් වසරක් සඳහා වන කොන්ත්‍රාත් පදනම මත වන අතර, සතුටුදායක කාර්යසාධනය මත ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයේ අවශ්‍යතාවය පරිදි සේවය දීර්ඝ කිරීමේ අවස්ථාව පවතී.

මේ සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයින් ඔවුන්ගේ ජීව දත්ත තොරතුරු අදාළ අධ්‍යාපන සහතික සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් සමග **ලේකම්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,** අංක 330, **යුනියන් පෙදෙස, කොළඹ 02** ලිපිනයට 2017 ජූලි 21 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන ලද තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**එච්.ටී. කමල් පත්මසිරි**
**ලේකම්,**
**පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.**